# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2421/54 - 2025 පෙබරවාරි මස 01 වැනි සෙනසුරාදා - 2025.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී. 1/2009 (ii)

**1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත**

61 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

වී සහ සහල් ගැනුම්කරුවෙකු, අලෙවි කරන්නෙකු, සැපයුම්කරුවෙකු, බෙදාහරින්නෙකු, පාහින්නෙකු, කොටන්නෙකු, හෝ සකස්කරන්නෙකු ලෙස ව්‍යාපාරික කටයුතු කරගෙන යෑම සඳහා 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතින් (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) වී අලෙවි මණ්ඩලය පිහිටුවීම සඳහා විධිවිධාන සලස්වා ඇති හෙයින් සහ වී සහ සහල් තොග රැස්කිරීම නියාමනය කිරීම සඳහා විධිවිධාන සලස්වා නොමැති හෙයින් ද:

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත යටතේ ස්වකීය බලතල, කාර්යය හා කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්ය සඳහා වී තොග රැස්කිරීම නියාමනය කිරීමට මණ්ඩලයට හැකිවනු පිණිස විධිවිධාන සැලසීම අවශ්‍ය වන හෙයින් ද:

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 61 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි විධාන කරමි :-


1A - PG 7016 — 204 (2025/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) මෙම නියමය ක්‍රියාත්මක වන දිනට යම් ගුදමක, සයිලෝවක, ගබඩාවක, බහාලුමක හෝ වෙන යම් ස්ථානයක යම්කිසි වී ප්‍රමාණයක් තමා සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින යම් තැනැත්තෙකු හෝ මෙම නියමය ක්‍රියාත්මක වීමේ දිනට හෝ ඊට පූර්වයෙන් 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන උපඡේදය යටතේ අංක 2231/23 සහ 2021 ජුනි මස 11 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 79 දරන විශේෂ විධානයේ විධිවිධාන ප්‍රකාර අවසර පත්‍රයක් ලබාගෙන සිටින යම් තැනැත්තෙකු හෝ, මෙම නියමය ක්‍රියාත්මක වන දින සිට හෝ එදිනට පසුව වී තොග රැස් කර තබාගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තෙකු වී තොග රැස් කර තබාගැනීමේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මෙම නියමය ක්‍රියාත්මක වන දින සිට මාස දෙකක් ඉකුත් වීමට පෙර මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය.

එසේ වුව ද, මෙම ඡේදයේ පෙරාතුව ම සඳහන් විධිවිධාන, තමාට අයිති වගාවෙන් ලබාගන්නා වී තොගයක් තබාගන්නා වී නිෂ්පාදකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය;

එසේම තවදුරටත්, තමාට අයත් වගාවෙන් ලබාගන්නා වී තොගයක් තබාගන්නා වී නිෂ්පාදකයකු විසින්, තමා වී වගා කරනු ලබන ප්‍රදේශය, වගා කර තිබෙන වී වර්ගය සහ ඔහු සන්තකයේ හෝ භාරයේ පවත්නා වී තොගයේ ප්‍රමාණයට අදාළ තොරතුරු මණ්ඩලය විසින් නියම කරනු ලබන අවස්ථාවක නියම කරනු ලබන ආකාරයට මණ්ඩලය වෙත ලබාදිය යුතුය;

(ආ) (අ) ඡේදය යටතේ ලියාපදිංචි වීමට අදහස් කරන යම් තැනැත්තකු I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් යුත් ඉල්ලුම්පත්‍රයක්, ඉල්ලුම් පත්‍ර ආකෘතියෙහි නිශ්චිතව දක්වා ඇති ලේඛනවල සහතික කළ පිටපත් ද සමග, සහ II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති තොග ධාරිතාව මත පදනම්ව නිශ්චය කරන ලද ගාස්තුවක් ද සමග මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ඇ) අවසරපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් මණ්ඩලය වෙත ලැබීමේ දී සහ ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සෑහීමට පත් වීමේ දී, මණ්ඩලය විසින්, III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ වූ අවසර පත්‍රයක් නිකුත් කළ හැකිය. එවැනි අවසර පත්‍රයක් IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු අතර, මණ්ඩලය විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එම අවසරපත්‍රය නිකුත් කළ දින සිට වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතු ය;

(ඈ) මණ්ඩලය විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු මණ්ඩලය විසින් ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු වන අතර, අවසර පත්‍ර ගාස්තුව ඉල්ලුම්කරු වෙත ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු සැලැස්විය යුතුය;

(ඉ) (ඇ) ඡේදය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු විසින්, දවසේ යම් සාධාරණ වේලාවක දී, යම් ගුදමකට, සයිලෝවකට, ගබඩාවකට හෝ බහාලුමකට හෝ වී ගබඩා කර තිබෙන වෙන යම් ස්ථානයකට ඇතුළුවීමට මණ්ඩලයේ සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයකුට පහසුකම් සැලසිය යුතු අතර, වී තොග රැස් කිරීමේ වාර්තා, ගිණුම් හෝ වෙනත් ලියකියවිලි පරීක්ෂා කිරීමට ඉඩ ලබාදිය යුතුය. අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති එම තැනැත්තා, අවශ්‍ය අවස්ථාවල දී එම ලේඛනවල පිටපත් හෝ උද්ධෘත අදාළ නිලධරයන්ට ලබා දිය යුතුය.

කුරගමගේ දොන් ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

2025 ජනවාරි මස 31 වැනි දින.
බත්තරමුල්ල.

**I වන උපලේඛනය**

**වී තොග රැස්කිරීමේ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රය**

* අනවශ්‍ය වචන කපා හරින්න

| | |
|---|---|
| මුදල් ගෙවන ලද කුවිතාන්සි අංකය | |
| ගෙවන ලද මුදල් ප්‍රමාණය (රු.) | |

**(අ). මූලික තොරතුරු**

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම | | | |
| | සිංහලෙන්/දෙමළෙන් | | | |
| | ඉංග්‍රීසියෙන් | | | |
| | ඉල්ලුම්කරුගේ ලිපිනය | | | |
| | ජාතික හැඳුනුම්පත් අංකය | | | |
| | දුරකථන අංක : | | ෆැක්ස් අංකය : | විද්‍යුත් තැපැල් ලිපිනය: |
| | ජංගම | | | |
| | ස්ථාවර | | | |
| 2. | ව්‍යාපාරයේ ස්වභාවය (අදාළ ස්ථානවල X යොදන්න) | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (අ) තනි පුද්ගල ව්‍යාපාරය | | (ආ) හවුල් ව්‍යාපාරය | |
| | (ඇ) සමාගම | | (ඈ) සමූපකාරය | |
| | (ඉ) ගොවි සංවිධානය | | (ඊ) රාජ්‍ය ආයතනය | |
| | (එ) වෙනත් | | | |

**(ආ). ව්‍යාපාරය පිළිබඳ තොරතුරු**

| | | |
|---|---|---|
| 3. | (අ) ව්‍යාපාරයේ නම | |
| | (ආ) ව්‍යාපාර ලියාපදිංචි අංකය | |
| 4. | (අ) වී තොග රැස්කර ඇති පරිශ්‍රයේ/පරිශ්‍රවල හිමිකරුගේ නම/ හිමිකරුවන්ගේ නම් | |
| | (ආ) වී තොග රැස්කර ඇති ස්ථානය බදු පදනම මත ලබාගෙන ඇතිනම් බදු ගිවිසුම්වල පිටපත් අමුණන්න | |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ඉල්ලුම්කරු, වී තොග රැස් කරනුයේ කවර පාර්ශවකරුවෙකු ලෙස ද යන වග (අදාළ ස්ථානවල X යොදන්න) | | | |
| | (අ) තොග රැස් කරන්නෙකු | | (ආ) ගබඩාකරුවෙකු | |
| | (ඇ) බෙදා හරින්නෙකු/ ප්‍රවාහකයකු | | (ඈ) තැරැව්කරුවෙකු | |
| | (ඉ) වී ගැනුම්කරුවෙකු | | (ඊ) මෝල්කරුවෙකු/සැකසුම් කරුවෙකු | |
| | (උ) වී තොග විකුණුම්කරුවෙකු | | (ඌ) වෙනත් (සඳහන් කරන්න) | |

**(ඇ). තොග රැස් කිරීමේ අවසරපත්‍රය ලබා ගැනීමට අපේක්ෂිත අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු තොරතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. | තොග රැස්කර ඇති පරිශ්‍රය/පරිශ්‍ර පිළිබඳ තොරතුරු | | | | |
| | (අ) තොග රැස්කර ඇති ආකාරය | | සංඛ්‍යාව | | මුළු ධාරිතාව (මෙට්‍රික්. ටොන්) |
| | ගොඩනැගිලි | | | | |
| | සයිලෝ | | | | |
| | බහාලුම් | | | | |
| | ගුදම් | | | | |
| | වෙනත් | | | | |
| | (ආ) පරිශ්‍රයේ ලිපිනය | | | | |
| | දුරකථන අංකය | | වරිපනම් අංකය | | |
| | ග්‍රාම නිලධාරි වසම : | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : | | |
| | දිස්ත්‍රික්කය | | | | |
| | (ඇ) වී තොග රැස්කර ඇති ස්ථානයට ළඟම පිහිටි නගරයේ නම හා එහි සිට අදාළ ස්ථානයට ඇති දුර (කි.මී.) හා ගමන් මාර්ගය. | | | | |
| 7. | වී තොග රැස් කරන ස්ථානය ගොඩනැගිල්ලක් නම් එහි පිරිවිතර | | | | |
| | ගබඩා කළ හැකි ධාරිතාව (මෙ.ටොන්) | | | | |
| | බිම් ප්‍රදේශය (Floor Area) (වර්ග මීටර් වලින්) : | | | | |
| | ගබඩා බිම පොළව මට්ටමේ සිට උස (සෙ. මීටර්) | | | | |
| | පැති බිත්තිවල සාමාන්‍ය උස (මීටර්) | | | | |
| **පහත සඳහන් කරුණුවලට අදාළව නිවැරදි තොරතුරු ඉදිරියේ යටින් ඉරක් අඳින්න. වෙනත් නම් හිස්තැනෙහි සටහන් කරන්න.** | | | | | |
| | ගබඩා බිම සකස්කර ඇත්තේ (සිමෙන්ති/ටයිල්/වෙනත් ......................) වලිනි. | | | | |
| | බිත්ති සකස්කර ඇත්තේ (සිමෙන්ති/ටකරන් තහඩු/වෙනත් ............................) වලිනි. | | | | |
| | වහල සඳහා යොදාගෙන ඇත්තේ (උළු/ඇස්බැස්ටස් තහඩු/වෙනත් ................) ය. | | | | |
| | ඇතුළු වීමේ දොරවල් සංඛ්‍යාව | | | | |
| | ගබඩාව ඇතුළට ලොරි රථ ඇතුල් වීමට හැකි/ නොහැකි බව | | | | |
| | ගබඩාව ඉදිකළ වර්ෂය | | | | |
| | ගබඩාව රක්ෂණය කර තිබේද යන්න එසේ නම් රක්ෂණ ඔප්පුවේ පිටපතක් අමුණන්න | | | | |
| 8. | වී තොග රැස්කර ඇත්තේ ගුදම්/සයිලෝ/බහාලුම්වල නම් එහි පිරිවිතර | | | | |
| | සංඛ්‍යාව | | | | |
| | ගබඩාකළ හැකි ධාරිතාව (මෙ.ටො.) | | | | |
| | සකස් කර ඇති ද්‍රව්‍ය (සිමෙන්ති/ තහඩු/ ලෝහ/ පොලිතීන්/ ප්ලාස්ටික්/ වෙනත් (නම් සඳහන් කරන්න) | | | | |

| | | |
|---|---|---|
| 9. | වියලන යන්ත්‍ර පවතී නම් එහි ධාරිතාව (මෙට්‍රික් ටොන්) | |
| 10. | පරිසර බලපත්‍රයක් ඇත්නම් එහි අංකය හා වලංගු කාල සීමාව (පිටපතක් අමුණන්න) | |
| 11. | පවතින කිරුම් තරාදි සංඛ්‍යාව සහ වර්ග | |
| | විදුලි පහසුකම් (ඇත/ නැත යනුවෙන් සඳහන් කරන්න) | |
| | ජල පහසුකම් (ඇත/නැත යනුවෙන් සඳහන් කරන්න) | |
| | ගිනි නිවන උපකරණ (ඇත/ නැත යනුවෙන් සඳහන් කරන්න) | |
| | වී තොග රැස්කිරීම සඳහා පාවිච්චි කරන වෙනත් උපකරණ ඇත්නම් සඳහන් කරන්න. | |
| 12. | වී තොග ගබඩා කරන ස්ථානයේ කාර්ය මණ්ඩලයේ විස්තර | |

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි.

..................................................

ඉල්ලුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :

## II වන උපලේඛනය

| *වාර්ෂික වී තොග රැස් කිරීමේ ධාරිතාව - මෙට්‍රික් ටොන්* | *වාර්ෂික අවසරපත් ගාස්තුව - රුපියල්* |
|---|---|
| 100 දක්වා | 2,500.00 |
| 100 ඉක්මවන 500 නොඉක්මවන | 5,000.00 |
| 500 ඉක්මවන 1,000 නොඉක්මවන | 7,500.00 |
| 1,000 ඉක්මවන 5,000 නොඉක්මවන | 10,000.00 |
| 5,000 ඉක්මවන 10,000 නොඉක්මවන | 12,500.00 |
| 10,000 ඉක්මවන 50,000 නොඉක්මවන | 15,000.00 |
| 50,000 ඉක්මවන 100,000 නොඉක්මවන | 20,000.00 |
| 100,000 ඉක්මවන | 50,000.00 |

## III වන උපලේඛනය

**1979 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 61(1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වී තොග රැස් කිරීමේ අවසරපත්‍රය**

අවසරපත්‍ර අංකය

1. අවසරපත්‍රලාභියාගේ නම :
2. අවසරපත්‍රලාභියාගේ ලිපිනය :
3. අවසරපත්‍රලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :
4. තොග රැස් කිරීම කරනු ලබන ස්ථානයේ/ ස්ථානවල ලිපිනය :
5. තොග ධාරිතාව :
6. අවසරපත්‍ර ගාස්තුව (රු.) :

7. අවසරපත්‍රය වලංගු කාලය ඃ
   (අ) ආරම්භක දිනය ඃ
   (ආ) අවසන්වන දිනය ඃ

ඉහත නම සඳහන් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද .................................. දිනැති ඉල්ලුම්පත්‍රය හා අංක ...................................... දරන ............................ දිනැති මුදල් ගෙවීමේ කුවිතාන්සිය සළකා බැලීමෙන් පසුව, ඉහත කී වී තොග රැස් කිරීමේ ස්ථානය/ ස්ථානවලදී ව්‍යාපාරයක් ලෙස වී තොග රැස් කිරීම සඳහා මෙම අවසරපත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබේ. මෙහි නිශ්චිත කොන්දේසිවලට යටත්ව මෙම අවසරපත්‍රය නිකුත් කරනු ලබන අතර, එකී කොන්දේසිවලට යටත්ව කටයුතු කිරීමට අවසරපත්‍රලාභියා බැඳී සිටී.

වී අලෙවි මණ්ඩලයේ බලය පිට නිකුත් කරන ලදී.

...........................................
අවසරපත්‍ර නිකුත් කිරීමේ නිලධරයා,

.........................................
නිල මුද්‍රාව

දිනය ඃ
ලිපිනය ඃ
වී අලෙවි මණ්ඩලයේ දී ය.

## IV වන උපලේඛනය

### අවසරපත්‍රයේ නියම සහ කොන්දේසි

1. අවසරපත්‍රය යම් තැනැත්තෙකුට පවරනු නොලැබිය යුතු අතර, අවසරපත්‍රය නිකුත් කරන ලද්දේ යම් තැනැත්තෙකු වෙත ද ඒ තැනැත්තා නොවන වෙනත් තැනැත්තෙකුගේ ප්‍රයෝජනය සඳහා එය භාවිතා කරනු නොලැබිය යුතු ය.

2. සෑම අවසරපත්‍රලාභියකු විසින් ම, පනත යටතේ තමා වෙත නිකුත් කරන ලද අවසරපත්‍රය තම ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

3. අවසරපත්‍රලාභීයා විසින්, මණ්ඩලයේ පූර්ව අනුමතය නොමැතිව අවසරපත්‍රය මගින් ආවරණය වූ ව්‍යාපාරයේ යම් සම්බන්ධතාවක් විකිණීම, පැවරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ ඒ ව්‍යාපාරයේ හිමිකාරත්ව බැඳීමක් වෙනත් යම් තැනැත්තෙකු විසින් සතු කරනු ලබන ආකාරයේ යම් ගිවිසුමකට, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන්, ඒ වෙනත් තැනැත්තා සමඟ ඇතුළත්වීම කරනු නොලැබිය යුතු ය.

4. අවසරපත්‍රය නැතිවූ විටක දිවුරුම් කොමසාරිස්වරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කරන ලද, නැතිවීම ස්ථිර කරන දිවුරුම් පෙත්සමක් අවසරපත්‍රලාභීයා විසින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත අවසරපත්‍ර ගාස්තුවෙන් අඩක් ගෙවූ විට මණ්ඩලය විසින් එහි සහතික පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

5. අවසරපත්‍රය නිකුත් කරන ලද්දේ යම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ද, ඒ ව්‍යාපාරය කරගෙන යාම නතර කරන්නා වූ හෝ තම ව්‍යාපාරික ස්ථානය වෙනස් කරන්නා වූ සෑම අවසරපත්‍රලාභියකු විසින් ම ඒ බව මණ්ඩලය වෙත වහාම දැනුම්දෙනු ලැබිය යුතු ය.

6. යම් පුද්ගලයකු වෙත නිකුත් කරන ලද අවසරපත්‍රයක් ඔහුගේ මරණින් පසු අවලංගු විය යුතු ය. පුද්ගලයකු යන්න පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට පුද්ගල මණ්ඩලය විසිරුවා හරිනු ලැබූ වහාම අවසරපත්‍රය ද අවලංගු විය යුතු ය.

7. මෙම අවසරපත්‍රයට අදාළ සියලු දැන්වීම් තත්කාලයේ ව්‍යාපාරික ස්ථානය භාර තැනැත්තා වෙත තැපැල් මඟින් යවනු ලැබුවහොත් හෝ භාරදෙනු ලැබුවහොත් හෝ අවසරපත්‍රලාභියාගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යවනු ලැබුවහොත්, ඒ දැන්වීම අවසරපත්‍රලාභියා වෙත යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

8. තොග රැස්කිරීමේ තම ව්‍යාපාරය කරගෙන යාම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් බලයලත් නිලධරයකු විසින් කලින් කල තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි සියලුම උපදෙස් අවසරපත්‍රලාභියා විසින් නොපමාව පිළිපැදිය යුතු ය. තොග රැස්කරන ආකාරය හා ඊට ආනුශංගිකව පවත්නා කරුණු සම්බන්ධයෙනුත් තමාගේ පරිශ්‍රයේ කිසියම් කොටසක් හෝ කොටස් ප්‍රතිසම්පාදනය *නැතහොත්* අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙනුත් දිය හැකි උපදෙස් ද වෙනත් කරුණු අතර ඉහත කී උපදෙස්වලට ඇතුළත් වේ.

9. අවසරපත්‍රලාභියා තමාගේ ව්‍යාපාරය පිළිබඳ නිසි වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් තබාගත යුතු අතර, මණ්ඩලයේ යම් බලයලත් නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා සියලුම සාධාරණ වේලාවන්හි දී ඒවා ඉදිරිපත් කළ යුතු ය. තව ද අවශ්‍ය වන ආකාරයට එම නිලධරයාට ඒවායේ පිටපත් හෝ උද්ධෘත ලබා ගැනීමට ද අවසරපත්‍රලාභියා විසින් පහසුකම් සැලැස්විය යුතු ය.

10. ඉහත සඳහන් කර ඇති වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත්වලට අමතරව, මණ්ඩලයේ යම් බලයලත් නිලධාරියෙකු විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි තවදුරටත් වූ වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් ද අවසරපත්‍රලාභියා විසින් පවත්වාගෙන යා යුතු අතර, එවැනි නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා සියලුම සාධාරණ වේලාවන්හි දී එකී වාර්තා, රෙජිස්ටර හා ගිණුම් පොත් ඉදිරිපත් කළ යුතු ය.

11. අවසරපත්‍රලාභියා විසින්, මණ්ඩලයේ යම් බලයලත් නිලධරයකු විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි කාල සීමාවක් තුළ, මෙම අවසරපත්‍රය නිකුත් කර තිබෙන්නේ යම් ව්‍යාපාර ස්ථානයක් කරගෙන යාමට ද එම ව්‍යාපාරික ස්ථානයෙහි තොග රැස්කිරීම පිළිබඳ නිසි වාර්තා හා සංඛ්‍යාලේඛන එම නිලධරයා වෙත භාරදිය යුතු ය.

12. මණ්ඩලයේ යම් බලයලත් නිලධරයකුට ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් පරිශ්‍රයකට සියලු ම සාධාරණ වේලාවන්හි දී ඇතුළත් වී තමාගේ ව්‍යාපාර කටයුතු හෝ ගබඩා කරන ලද වී පරීක්ෂා කිරීමට අවසරපත්‍රලාභියා අවසර දිය යුතු අතර, අදාළ පොත් හෝ ලේඛන සහ එම පරිශ්‍රය තුළ තිබෙන වී තොග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

13. අවසරපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම්පතෙහි දක්වා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව සොයාගනු ලැබුවේ නම්, අවසරපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත්විය යුතු ය.

EOG 02-0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.